සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

01. ශිෂ්‍යයා විදුහල්පතිතුමා හමුවේ **තමා කළ වරද ප්‍රකාශ කරමින්** සමාව අයැද සිටියේය.

(1) සාක්ෂිදීම (2) පුනරුච්චාරණය (3) පාපොච්චාරණය (4) උච්චාරණය

02. බලාපොරොත්තු වූ මුදල නොලැබීම නිසා, ඔහුගේ **සිතේහි ඇති වූ අසතුට මුහුණින් දිස්විය.**

(1) මුහුණ කළුවුණා (2) මුහුණ මැලවී ගියා (3) ඇස් රතුවිය (4) මුහුණ පිම්බී ගියා

03. **උදාසීන ගතියක්** පාමන් මල්ලී පොත අතට ගත්තේය.

(1) අවලාද නගමින් (2) ඇලිමැලි කරමින්
(3) මුහුණ ඇඹුල් කර ගනිමින් (4) බැරි බැරියේ

- **අක්ෂර වින්‍යාසය නිවරදිව යෙදී ඇති පදය තෝරන්න.**

04. (1) විෂ්මය (2) ආභාෂය (3) විශිෂ්ඨ (4) මද්‍යසාර

- **අක්ෂර වින්‍යාසය නිවරදිව යෙදී නැති පදය තෝරන්න.**

05. (1) සංශ්ලේෂණය (2) විශ්ලේෂණය (3) විශ්වාශය (4) ආස්වාදය

06. අකාරාදී පිළිවෙළට ගළපා ඇති පද පේළිය තෝරන්න.

(1) තෝනිගල, දඹුල්ල, නිලගම, මිහින්තලේ, සිතුල්පව්ව
(2) වෙස්සගිරිය, රිටිගල, වල්ලිපුරම්, මිහින්තලේ, නිගලම
(3) තිඹිරිවැව, වේවැල්කැටිය, ජේතවනරාමය, විහාරගල, රිටිගල
(4) දඹුල්ල, සිතුල්පව්ව, වවුනියාව, වල්ලිපුරම්, මහරත්මලේ

07. යංශය, රේඵය, රකාරංශය, ගයනුකිත්ත පිළිවෙළින් යෙදී ඇති පේළිය තෝරන්න.

(1) ගෞතම, කාර්‍ය්‍ය, ශාඛ්‍ය, ප්‍රවීණ (2) වාක්‍යය, ආයර්‍යෝ, ප්‍රාචීන, ඖෂධ
(3) සූර්‍ය්‍යයා, කෞශල්‍යය, ප්‍රධාන, මාර්ගය (4) ප්‍රවීණ, කර්‍මය, කාර්‍ය්‍යාලය, ගෞරවය

- **දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.**

08. පොළව - (1) දෙරණ (2) මේදිනි (3) වසුන්දරා (4) භූපති

09. ලෝකය - (1) දිය (2) භවන (3) ගුවන (4) ජගත්

- **10 සිට 13 තෙක් වාක්‍යවල හිස්තැනට වඩාත් ගැළපෙන පදය තෝරන්න.**

10. ශ්‍රී ලාංකිකයා ......................... මුදවා ගැනීමේ අභිලාෂයෙන් මහින්ද හිමියෝ බොහෝ නිර්මාණ කළහ.

(1) පරාධීනත්වයෙන් (2) ආත්මානුකම්පාවෙන්

(3) දේශානුරාගයෙන් (4) ස්වාධීනත්වයෙන්

11. කාව්‍යයක ......................... නිපදවීම සඳහා වෘත්තය, ලය, අනුප්‍රාසය ආදිය උපකාර වේ.

(1) අර්ථරසය (2) එළිසමය (3) ශබ්දරසය (4) වාච්‍යාර්ථය

12. ''කමත'' යන්න ඇතැම් ප්‍රදේශවල ගැමියෝ ......................... යනුවෙන් භාවිතා කරති.

(1) වගා ඉස්සර (2) කලවිට (3) උබර (4) කෙත

13. හේන ගිනිතැබීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව ......................... වේ.

(1) අක්වැස්ස (2) මොර වැස්ස (3) අසනිවැස්ස (4) මෝසම් වැස්ස

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

14. අපක්ෂපාතී ........................................ පහළ වේවා !

(1) නායකයෙකු (2) නායකයෙක් (3) නායකයෝ (4) නායකයන්

15. දක්ෂ ........................................ වන්නේ කෙසේද?

(1) ක්‍රීඩිකාවක් (2) ක්‍රිඩිකාවක (3) ක්‍රිඩිකාවෝ (4) ක්‍රිඩකයෝ

16. සියලු ........................................ සත්‍යගරුක විය යුත්තෝ ය.

(1) සත්වයන් (2) මිනිස්සු (3) ශිෂ්‍යයන් (4) ගැහැණුන්

17. ........................................ දක්ෂ ........................................ වෙමි.

(1) මා, ගායිකාවක, (2) මා, ගායිකාවක් (3) මම, ගායිකාවක් (4) මම, ගායිකාවක

18. අයෙක් සුරාමතින් ........................................

(1) නටති (2) නටයි (3) නටන්නේය (4) නැටීය

- **පහත දැක්වෙන වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය තෝරන්න.**

19. (1) ළමා පෙළ ව්‍යායාමයේ යෙදෙති. (2) රක්පෙළ සුළඟට සෙලවෙති.

(3) තරුපෙළ අහසේ බබළති. (4) රළ පෙළ වෙරළට ඇදෙති.

20. (1) ආනන්ද නාහිමියන් වහන්සේ වෙහෙර වටා සක්මන් කළේය.

(2) අපි දක්ෂ දරුවෝ වෙමු.

(3) ඇතමෙක් මහහඬින් සිනාසෙයි.

(4) පිට්ටනියේ ළමයින් සෙල්ලම් කළහ.

21. (1) නිමාලි පියනගද්දී ගුරුතුමිය එතනට එයි. (2) නංගී ළමයෙක් කැටුව ළිඳට ගියාය.

(3) දෙමාපියන් සමඟ දරුවෝ පාසල් යති. (4) මා බුදුන් වදිමි.

- **දී ඇති ප්‍රකාශවලට සමාන අදහස දැක්වෙන වරණය තෝරන්න.**

22. මැස්ස මත අඩනින්දේ සිටි අප පිබිදුණේ ගස මුලට පැමිණි මිතුරන් අප අමතන විටය.

(1) මිතුරන් කතා කරන තෙක් අප සිටියේ අඩ නින්දේය.

(2) මිතුරන් කතා කරන විටත් අප නැගිට සිටියේය.

(3) මිතුරන්ගේ හඬින් අපි මැස්සමත හිඳගත්තෙමු.

(4) අපට මැස්මත හොඳින් නින්ද ගියේය.

23. වර්ත මානයේ තරම් ළමා පරම්පරාවේ දුක්ඛදායක සිද්ධීන් තවත් නොවීය.

(1) වර්තමානයේ දුක්ඛදායක වන්නේ ළමා සිදුවීම්ය.

(2) සෝචනීය සිදුවීම්වලට වර්තමානය මුල් වේ.

(3) ළමා පරපුරට වර්තමානය එතරම් සුබදායි නොවේ.

(4) වර්තමානය ළමා පරපුරේ දුක්ඛදායක කාලයයි.

- **පහත සඳහන් පද යුගලවල ඇති දෙවන පදය පළමු පදය හා අර්ථයෙන් සමාන ද අර්ථයෙන් විරුද්ධ ද පළමු පදයේ අර්ථය වැඩි කිරීමක් ද වෙනස් අර්ථයක් ගෙනදේ ද යන්න තෝරන්න.**

24. විවෘත - සංවෘත (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

25. ශ්‍රේෂ්ඨතර - ශ්‍රේෂ්ඨතම (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

26. විසල් - සුවිසල් (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

27. පිටුවහල - පිටිවහල (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

- **මුලින් දී ඇති කොටසේ අර්ථය ප්‍රකාශ වන යෙදුම යටින් ඉරක් අඳින්න.**

28. කරල පැහුණ

(1) බලාපොරොත්තු සුන්වුණා (2) වාසියක් වුණා

(3) අස්වනු වැඩි වුනා (4) කරල් කහ ගැහුනා

29. අර අදිනවා

(1) මගහරිනවා (2) බලාපොරොත්තුවෙන් ඉන්නවා

(3) කම්මැලිබවක් දක්වනවා (4) සූදානම් වෙනවා

- **පහත ප්‍රශ්නවල දී ඇති යෙදුමට සමාන අර්ථයක් දෙන වචනය තෝරන්න.**

30. බඩේ ගින්දර

(1) බඩේ කැක්කුම (2) බඩේ උණුසුම (3) බඩ වේදනාව (4) බඩගින්න

31. ඉස්පාසුවක්

(1) කරදරයක් (2) දුකක් (3) විවේකයක් (4) විනෝදයක්

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

32. නාට්‍ය පෙළ යනු,

(1) නාට්‍ය නළු නිළියන්ය. (2) නාට්‍ය පිටපත.

(3) නාට්‍ය නිෂ්පාදනය. (4) නාට්‍ය ශෛලය

33. නාට්‍යයක මුහුණේ ඉරියව් මඟින් අදහස් ප්‍රකාශනය,

(1) අංගික අභිනය. (2) වාචික අභිනය. (3) ආහාර්ය අභිනය. (4) සාත්වික අභිනය.

34. 'වත රතු පුල් - නෙත නිලු පුල්' මෙහි ඇති අලංකාරය නම්,

(1) උපමා අලංකාරයකි. (2) රූපක අලංකාරයකි.

(3) උත්ප්‍රාසා අලංකාරයකි. (4) අර්ථ අලංකාරයකි.

35. රූ රැසේ අදිනාලෙසේ අත් ළෙලදිදී විදුලිය පබා..........

රන් රසේ එක්වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා..........

මෙම පැදි පෙළේ විරිත වන්නේ,

(1) පෙද විරිත (2) සක්වා විරිත (3) විසිහයමත් විරිත (4) මාලතී විරිත

- **පහත සඳහන් ඡේදය කියවා අංක 36 සිට 40 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

රාජසිංහයන්ගේ රාජ්‍යකාලය සීතාවකට කෘත යුගයකි. මෙලක රාජමන්දිරයෙන්ද අමාත්‍යාදිනට වාසස්ථානය වූ ප්‍රාසාදයන් ගෙන්ද සල්පිල් පෙලින්ද නොයෙක් මං මාවත් වලින් ද විහාරස්ථානයන් ගෙන් හා දේවස්ථානයන් ගෙන් මේ නගරයට අඩුවක් නොවීය. භූමි ලක්‍ෂණයෙන්ම සීතාවක රමණීය ප්‍රදේශයකි. සතුරු උවදුරකදී රක්ෂාවරණය දෙන ස්වංසිද්ධ කොට්ටාරයකි. සමශිතෝෂණ දේශ ගුණයෙන් සිසිල් සුළඟින් ද යුක්ත වූ ආරෝග්‍ය ස්ථානයකි. මෙහි පොළොව සරුය. කෙත්වත්වලින් යුතුය.

36. මෙම ප්‍රදේශයේ සඳහන් නොවන ස්ථානයක් වන්නේ,

(1) පන්සල් (2) දේවාල (3) පාසල් (4) වෙළඳසල්

37. මෙහි දැක්වෙන රාජධානිය වන්නේ,

(1) ගම්පොළ (2) සීතාවක (3) රයිගම (4) කෝට්ටේ

38. කෘත යුගය යනුවෙන් හැඳින්වෙන අදහස වන්නේ කුමක්ද?

(1) ලෝකයේ ඉපැරණි යුගය (2) ලෝකයේ සමෘද්ධිමත් යුගය

(3) පරාදීන යුගය (4) වැඩවසම් යුගය

39. කොට්ටාරයක් යනු,

(1) පර්වත ප්‍රදේශයක් (2) කඳුකර ප්‍රදේශයක්

(3) බලකොටුවක් (4) රක්ෂිත ප්‍රදේශයක්

40. මෙම ඡේදයේ දැක්වෙන යුගල පදයක් නොවන පදය වන්නේ,

(1) ස්වංසිද්ධි (2) කඳුහෙල් (3) කෙත්වත් (4) මංමාවත්

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 20180

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයෘ |
|---|

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) කණ්ඨජ අල්පප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න

(ii) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.

(අ) මහල්ලෝ (ආ) කන්ද

(iii) පහත සඳහන් වාක්‍ය වල කළු අකුරින් මුද්‍රිත පදවල ක්‍රියාවර්ග නම් කරන්න.

(අ) ඉතා සරු භූමිය පවා වගා **නොකළහොත්** වල් පැළවලින් පිරියනු ඇත.

(ආ) ''බල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙන.''

(iv) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමුවන වචනය සමඟ දෙවෙනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙනසේ පළමු වචනය හෝ දෙවැනි වචනය හෝ වෙනස් කර ලියන්න.

(අ) අමාත්‍ය මඩුල්ල (ආ) සුදු ඡත්‍රය

(v) පහත සඳහන් ඉඟිවැකිමගින් පළවන අර්ථය ලියා දක්වන්න.

(අ) ලැල්ලට පාගලා ගියා (ආ) අබමල් රේණුවක්වත්

(vi) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(අ) නිවට කරණවෑමියා දුටුවාම ..........................................................

(ආ) නොකරෙන දී ගෙට ..........................................................

(vii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(අ) ළමයි කුරුල්ලන් බලා සතුටු වෙති.

(ආ) ගුරුළුගෝමීහු අමාවතුර ලියූහ.

(viii) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

(අ) පයින්යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.

(ආ) සභාතොමෝ සතුටින් විසිර ගියහ.

(ix) පහත දැක්වෙන වාක්‍යයේ අනුක්ත පදයන් හා නිපාත පදයක් තෝරා ලියන්න.

''පින් පිඬ වැනි මා මැණිය කියනු නොවලහා.''

(x) පහත සඳහන් ප්‍රාදේශිය ව්‍යවහාරයන් සඳහා භාවිතා වන සාමන්‍ය ව්‍යවහාර ලියා දක්වන්න.

(අ) මහඑකා (ආ) සනුහරේ (ලකුණු $2 \times 10 = 20$)

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන කොටස් වලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යොග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අප රටේ ජනාවාස ගොඩනැගුණේ ප්‍රධාන ජීවන ක්‍රමයවන කෘෂිකර්මාන්තයට සුදුසු පරිසරයන්හිය. කෘෂිකාර්මික දියුණුවකින් තොරව ශ්‍රී ලංකාව වැනි රටක් දියුණු කළ නොහැකිය. වරින් වර මතුවන ලෝක ආහාර අර්බුදයන්හි නොසැලි මුහුණ දීමට කෘෂිකර්මාන්තය දියුණු කොට අපේ ආහාර අවශ්‍යතා මෙන්ම වෙනත් මූලික අවශ්‍යතා සපුරාගත යුතුය.

(ආ) අද දිනපතා දක්නට ලැබෙන රිය අනතුරු සංඛ්‍යාව විශාලය. රිය අනතුරු සිදුවීමට රියදුරන් මෙන්ම මගින්ගේ නොසැලකිල්ලද හේතු වෙයි. රියදුරන් මාර්ග නීති හරිහැටි පිළිනොගැනීම හා ඔවුන් අනෙකා පරයායාමට ගන්නා උත්සාහයන් නිසාත්, අධික ලෙස අවිවේකය යන කරුණු කාරණා වේ. පදිකයන්ද ඔවුන්ට අදාළ නිතිරීති අනුගමනය කළ යුතුය. එසේ නොවුන හොත් විශාල විනාශයක් සිදු වෙයි.

(ඉ) කවදා කවුරුන් විසින් නිර්මාණය කරන ලදදැයි කිව නොහැකි විවිධ අන්දමේ ජනකවි වර්ග ඇත. ගැමි සුවද වහනය වන ජනකවි අපේ සංස්කෘතියේ අනන්‍යතාවයයි. අපේ සාහිත්‍යයද පෝෂණය කරන ජනකවි තවත් කාලාන්තරයක් වුවද පවතිනු ඇත.

(ඊ) අපේ රට ලෝකයේ අවධානයට යොමු වුයේ ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් ලද ජයග්‍රහන නිසාය. ක්‍රිකට් ලෝක කුසලානය, ඔලිම්පික් පදක්කම් ඊට මුල්විය. ක්‍රිඩාව රටක් වශයෙන් ලබන ජයග්‍රහණ මෙන්ම නිරෝගී ජාතියක් බිහි කිරීමට ද වැදගත් වේ. එමෙන්ම හුදෙක්ම ජයග්‍රහණයට නොව පරාජයද විද දරා ගැනීමේ හැකියාව ලැබීම ද ක්‍රීඩාවේ විශිෂ්ට ගුණයකි.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 50 - 55 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

බ්‍රිතන්‍ය යුගයේදී අපේ ගම්වල පරිපාලනය භාරව කටයුතු කළ වරප්‍රසාද ලත් ප්‍රභූන් පිරිසක් නිර්මාණය වී සිටියහ. රජයේ නිලධාරින්ගෙන් සමන්විත වු මෙම පන්තිය මුහන්දිරම්, වෙල්විදානේ, විදානාරච්චි, පොලිස් විදානේ, ගම්මුලාදෑනින්, පොලිස් නිලධාරින් ලෙස විවිධ තනතුරු භාරව කටයුතු කළ බව එකල සමාජයේ දක්නට ලැබිණ. මෙම පුද්ගලයන් ගම්වල සමාජ, ආර්ථික කටයුතු සමගාමිව කළ බව ද පෙනේ. එම නිලධාරින් පාලන කටයුතු ගෙනගිය ආකාරයත් එකල පැවැති සමාජ ව්‍යුහයේ සංවිධානාත්මක ස්වරූපයක් ගැන බොහෝ කරුණු රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත් විවිධ දිස්ත්‍රික්කවලට අයත් කච්චේරි ලේඛනවල ඇතුළත් තොරතුරුවලින් අනාවරණය වේ. මෙම තනතුරු ධූරාවලින් මගින් විශදවන කරුණු පිළිබඳව මෙතෙක් ලියවි ඇති ප්‍රමාණය ඉතා සීමාසහිතය. එයිනුදු ප්‍රාථමික මුලාශ්‍ර ඇසුරු කොට ඇත්තේ ඉතා සීමාසහිත පිරිසකි. අවම පර්යේෂකයින් කොටසක් ස්පර්ශ කළ දත්තයන් පසෙක .තබා කච්චේරි ලේඛන බොහෝ ප්‍රමාණයක් ඇසුරු කොට මේ කරුණු රැසක් අනාවරණය කිරිමට හැකිවේ.

(ලකුණු 10)

04 පහත සඳහන් පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගසට අබරණය ගස හිස පිපුණු මල
විලට අබරණය විලතුල මසුන් කැල
මවට අබරණය දුදරු ළපැටි පෙල
ගුරුට අබරණය ගුරුසිසු සිල්ප සල

ගුරු සිත් නො රිදවා සිල්ලැබ බාල සඳ
බැති සිත් උපදවා කර පෙම් අකුරු සඳ
ගරුකොට දෙපාවැඳ-ඉඩඇති විටෙක ළඳ
මූසිලවරු නොවී ඉමු ළමයිනේ සොඳ

(i) ''ගස හිස'' යන්නෙහි මෙහි අදහස් වන්නේ කුමක්ද?

(ii) මෙහි අබරණ යන්නෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

(iii) පිපුණු මල්, මාළු රංචු, දූ දරුවන්, සිසුදරුදැරියන්, අබරණ ලෙස සැලකෙන්නේ කාහට දැයි පිළිවෙළින් ලියන්න.

(iv) බාල සඳ, අකුරු සඳ යන වචනවල ''සඳ'' යන්නේ තේරුම වෙන වෙනම ලියන්න.

(v) ''මූසිලවරු නොවි ඉමු'' යනුවෙන් කියවෙන්නේ කුමන අදහසක් ද?

(ලකුණු 2 x 5 = 10)

05 ඔබ විද්‍යාලයේ ශිෂය නායක නායිකාවන් සඳහා පැවැත්වෙන වැඩමුළුවක න්‍යාය පත්‍රය සකස් කරන්න. ශිෂ්‍ය නායකයින්ට පදක්කම් පැළදවීම ද එදින සිදුවන බව සලකා එය සකස් කරන්න.

<u>නැතහොත්</u>

ඔබේ පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් විමල් දිසානායක ඔබ යැයි සිතා, සාහිත්‍ය සංගමය විසින් ඔබ පාසලට ගෙන්වනු ලබන ''සිංහබාහු'' නාට්‍ය පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ අත් පත්‍රිකාවක් සකස් කරන්න.
(වචන 100 ක් පමණ සෑහේ) (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණ සියවස කුමක් ද?
(ආ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ කුමක් ද?

(ii) ''කියව ආචාරීනි, තොප කීවාක් කෙරෙමි''
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද? (ආ) මෙහි ආචාරීනී යනු කවරෙක් ද?

(iii) (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුරුන් ද?
(ආ) වැත්තෑවේ හිමියන්ගේ ගුරුහිමියන් කවුරුන් ද?

(iv) මන මත් කරවන දන මුළු දෙරණා
රසවත් වන වෙණ නද නද කරණා
..........................................................................
..........................................................................
(අ) ඉහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් කෘතිය කුමක් ද?

(v) (අ) බැද්දේගම නව කතාවේ මුල් කෘතිය කුමක් ද?
(ආ) එම මුල් කෘතිය ලියවුණ වර්ෂය කුමක් ද?

(vi) (අ) බැද්දේගම නව කතාවේ පරිවර්තකයා කවුරුන් ද?
(ආ) ඔහු විසින් පරිවර්තනය කරන ලද තවත් කතා දෙකක නම් ලියන්න.

(vii) ''උඹේ ගම කොහෙද ළමයා''
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද? (ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(viii) වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
..........................................................................
..........................................................................
(අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(ආ) ඉහත කවිය කුමන ජන කවි අංගයකට අයත්වේ ද?

(ix) වෙර නැති දා ගහගත්තේ දිනන්න ද
යුද නැති දා නැති කග කොස් කොටන්න ද
(අ) ඉහත කවි පදවල අංකිත පදවල අරුත් ලියන්න.
(ආ) ශාන්තිකර්මවල යෙදුන ජනයා දෙවියන් උදෙසා ගැයූ කවි වර්ගයක් ලියන්න.

(x) ''පුත මේ යුක්තිය සලකා පියා කියව''
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය කාහට කළ ප්‍රකාශයක් ද? (ලකුණු 2 x 10 = 20)

02 පහත දක්වා ඇති ගද්‍ය, පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුර ඔර වසමින් සිටි රග කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වු වැනි

(අ) අංකිත පදවල අරුත් ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(ii) ''කොළ පවිටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල''

(අ) ඉහත කොටසේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියා දක්වන්න.

(iii) ..........................................................................................
..........................................................................................
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමව් නෙළුව පලා

(අ) ඉහත කවියේ මුල්පද සම්පූර්ණ කරන්න.

(ආ) මෙහි ඇති සම්ප්‍රදායික යෙදුම උපුටා ලියන්න.

(iv) ඝෝෂා සහිත කලබල වීදිවලින් තැති ගෙන සිටි පුංචි මැණිකා ජන ශූන්‍ය නිශ්චල ස්ථානයකට පැමිණීම ගැන ආනන්දිතව එහි ඇන තියා හිඳ ගත්තාය.

(අ) මෙහි අංකිත පදවල අර්ථය වෙනම ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියා දක්වන්න.

(v) තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය සිරි සඳ ගෙන වැලැන්දේ

(අ) මෙහි අංකිත පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න. (ලකුණු 4 x 5 = 20)

03 උම්මග්ග ජාතකයේ එන,

(i) මහෞෂධ පඬිඳුන්ගේ චරිතයේ පරාර්ථකාමී බවත්

(ii) කේවට්ට බමුණාගේ චරිතයේ ස්වාර්ථකාමී බවත්

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

ගුත්තිල කාව්‍ය

(i) අර්ථ රසයෙන් ද

(ii) ශබ්ද රසයෙන් ද අනූන කාව්‍ය නිර්මාණයකි.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන සනාථ කරන්න. (ලකුණු 15)

04 (i) යහපත් ජීවිතයක් සඳහා ජන කවියෙන් ලද හැකි ආභාසයත්

(ii) උපදේශ තහවුරු කිරීම සඳහා යොදා ගත් කාව්‍යාලංකාරවල යෝග්‍ය බවත් සැලකිල්ලට ගනිමින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පහදන්න.

නැතහොත්

බැද්දේගම නවකතාවේ සිලිඳු ඇතුලු පවුලේ උදවිය

(i) සමාජ අසාධාරණකම්වලට ද

(ii) සොබා දහමේ පීඩාවලට ද ලක්වන ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

- **ප්‍රශ්න අංක 05, 06, 07 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

05 බැද්දේගම ගම්මානය හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වී ඇත. මේ කියනමන උදාහරණ 3ක් දක්වමින් සනාථ කරන්න. (ලකුණු 10)

06 වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභා පූර්ණ කවිත්වය නළලගන රුගුමෙන් විදහා දක්වේ. මේ කියමන උදාහරණ 3ක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07 මහෞෂධ පඬිතුමාගේ උපාය කෞශල්‍ය හේතුවෙන් වේදේහ රාජ්‍ය ආරක්ෂා වූ අයුරු උදාහරණ 3ක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (3) | 11 - (3) | 21 - (3) | 31 - (3) |
| 2 - (2) | 12 - (2) | 22 - (1) | 32 - (2) |
| 3 - (2) | 13 - (1) | 23 - (4) | 33 - (3) |
| 4 - (4) | 14 - (2) | 24 - (2) | 34 - (2) |
| 5 - (3) | 15 - (2) | 25 - (3) | 35 - (3) |
| 6 - (1) | 16 - (2) | 26 - (3) | 36 - (3) |
| 7 - (2) | 17 - (3) | 27 - (4) | 37 - (2) |
| 8 - (4) | 18 - (1) | 28 - (2) | 38 - (2) |
| 9 - (2) | 19 - (1) | 29 - (4) | 39 - (3) |
| 10 - (1) | 20 - (2) | 30 - (4) | 40 - (1) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (i) ක, ග

(ii) (අ) මහලු (ආ) කඳු

(iii) (අ) අසම්භාව්‍ය (ආ) විධි ක්‍රියා

(iv) (අ) ඇමැති මඬුල්ල, අමාත්‍යමණ්ඩලය (ආ) ශ්වේත ඡත්‍රය, සුදු කුඩය

(v) (අ) ඉතා වේගයෙන් (ආ) ස්වල්පයක්වත් / ඉතා ටිකක්වත්

(vi) (අ) එළුවොත් එනවලු රුවුල පාන්න
(ආ) කෝන්දුරු තෙල් හත්පට්ටියකුත් තව ටිකක් ඔනැලු / හෙවනැල්ලත් ඇදලු

(vii) (අ) ළමයින් විසින් කුරුල්ලෝ බලා සතුටු වනු ලබති.
(ආ) ගුරුළුගෝමින් විසින් අමාවතුර ලියන ලදි / ලියවිණි

(viii) (අ) යායුතුය (ආ) ගියාය

(ix) (අ) මා, මැණි - අනුක්ත , වැනි - නිපාත

(x) (අ) මහළුකා - අලියා , සනුහරේ - පරම්පරාව

02 සුදුසු ලෙස මාතෘකා පිළිගෙන සම්මත ක්‍රමය අනුව රචනයට ලකුණු පිරිනමන්න.

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
2. සංවිධානය, නිර්මාණාත්මක බව හා ස්වීයත්වය ලකුණු 12
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා තිබීම ලකුණු 05 මුළු ලකුණු 25 යි.

03 සාරාංශය

මෙරට බ්‍රිතාන්‍ය පාලනය පැවැති සමයේ වූ වරප්‍රසාද ලත් ප්‍රභූ පන්තිය පිළිබඳව තොරතුරු කච්චේරි ලිපි ලේඛන ඇතුළු ප්‍රාථමික මූලාශ්‍රවලින් අනාවරණය වේ. මේ ගැන මෙතෙක් හෙළිවී ඇත්තේ සීමිත කරුණු කීපයකි. ඉහත දත්ත අනුව එම ප්‍රභූ පන්තිය මෙහි පාලනය ගෙනගිය අයුරු, එකල පාලන සංවිධාන ව්‍යුහය ආදී තොරතුරු රැසක් දැන ගැනීමට පුළුවන.

(වචන 53)

04 (i) ගස මුදුනේ යන්නයි.

(ii) ආභරණයකි, අලංකාරය ඇති කරන්නකි.

(iii) මල් - ගසට , මාලු රංචු - විලට , දූදරුවන් - මවට , සිසුන් - ගුරුන්ට

(iv) සඳ - බාල කාලයේ සඳ - අකුරු (උතුම් වූ අකුරු)

(v) ගුරුවරුන්ට එරෙහි නොවී, ඔවුන්ට කීකරුව සිටිය යුතුයි.
(සමාන පිළිතුරක් ඇතොත් පිළිගන්න) (ලකුණු 10)

05 න්‍යාය පත්‍රය - ශිල්පීය දක්ෂතා ලකුණු 03
ආකෘතිය ලකුණු 02
අන්තර්ගත කරුණු ලකුණු 10 මුළු ලකුණු 15 යි.

<u>නැතහොත්</u>

අත්පත්‍රිකා - ආකෘතිය ලකුණු 05
අන්තර්ගතය ලකුණු 07
ශිල්පීය දක්ෂතා ලකුණු 03 මුළු ලකුණු 15 යි.

## III කොටස

01 (i) (අ) 14 වන සියවස (ආ) මහෞෂධ පඬිඳුන්ගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම

(ii) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු (ආ) කේවට්ට බමුණා

(iii) (අ) සලාවත ජයපාල මැතිඳුන් (ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

(iv) (අ) සවනොත් සඳ පුරගන ලොබ දියුණා
නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා (ආ) ගුත්තිල කාව්‍ය

(v) (අ) විලේජ් ඉන්ද ජංගල් (Village in the Jungle) (ආ) 1913

(vi) (අ) ඒ. පි. ගුණරත්න (ආ) වානරයා / වනසරණ / මැකී ගිය දඩමං / සුදු ගෝනා

(vii) (අ) තංගල්ලේ දී හමුවූ මහල්ලා / පුංචි මැණිකා සීයේ කියූ තැනැත්තා (ආ) පුංචි මැණිකාට

(viii) (අ) වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ (ආ) දූනමුතුකමට කී කවි / උපදෙස් දීම සඳහා කී කවි

(ix) (අ) වීර්යය - කඩුව, අසිපත (ආ) දෙවොල්මඩු කවි / ගම්මඩු කවි / කෝල් මුර කවි

(x) (අ) තලතා දේවිය (ආ) චූලනී බ්‍රහ්මදත්ත (ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) උතුම් වීණා නාදය - නගරයේ අහස / පුරයේ අහස

(ආ) සිතේ සතුටින් උතුම් වීනා නාදය අසමින් පක්ෂීහු සංචාරය අතහැර පියාපත් විහිදාගෙන නගර ආකාසයේ සිටි ආකාරය කෙසේද යත් දිව්‍ය සේනාවට දිව්‍ය ආසන පැනවූවාක් වැනි විය.

(ii) (අ) නින්දිත / මෝඩ

(ආ) බොල, පාපී දුෂ්ට අධර්මිෂ්ඨ නින්දිත අයහපත් හැසිරීම් ඇති විරූපී මෝඩ බමුණු මහල්ල

(iii) (අ) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා

(ආ) දුවන මුවන් දැක නොදමවී නෙළුව පලා

(iv) (අ) ජනතාව නොමැති / මිනිසුන් නැති
සතුටුව / සතුටට පත්වී

(ආ) ශබ්ද සහිත කලබලකාරී පටු මාවත්වල බිය වී සිටි පුංචි මැණිකා මිනිසුන් නැති නිස්කලංක තැනකට පැමිණීම ගැන සතුටුව එතැන ඇන තියා හිඳගත්තා ය.

(v) (අ) ප්‍රතිවාදියා, විරුද්ධවාදියා - ශ්‍රියා කාන්තාව

(ආ) සින්දේ වීණා තත පමණ ද? ප්‍රතිමල්ලවයාගේ එඩිය ද සින්දේ ය. / කීර්තිය දිගන්තයෙහි චිත්‍රනය කළේය. විජය ශ්‍රී කාන්තාව වැළඳගත්තේ ය. (ලකුණු 4 x 5 = 20)

03 (i) එක් සියයක් රජ දරුවන්ගේ ජීවිත බේරීම / වේදේහ රජ්ජුරුවන්ගේ භය නැතිකිරීම වැනි අවස්ථා හා මහෞෂධ චරිතය පුරා පවතින පරාර්ථකාමී ලක්ෂණ වලින් 2 ක් උදාහරණ සහිතව දක්වා තිබීම.

(ii) සිරියහන් ගැබේ සිට කල්පනා කරන අවස්ථාව, අග්‍ර පුරෝහිත වීමට කල්පනා කිරීම / කූට උපායක් මගින් යුද්ධය දිනීමට සිතීම / ධර්ම යුද්ධ ආදී සුදුසු අවස්ථා හා සිදුවීම් වලින් අදාළ උද්ධෘත සහිතව ලියා තිබීම

<u>නැතහොත්</u>

අර්ථ රසය

කන් කලු වෛණ නද ඇසුමෙහි ලොබිනේ / නිති නිරිඳුගෙ රැකවලෙහි ..... / මන්මත් කරවන දන මුළු දෙරණා වැනි ගැළපෙන උදාහරණ

ශබ්ද රසය

රූ රැසේ අඳිනා ලෙසේ.... / පුන් මදාරා.... / ළඟ ළඟවා උනුනට කර වාදය වැනි ගැළපෙන උදාහරණ

(ලකුණු 15)

04 යහපත් දිවියකට ආභාසය

වරද පෙනෙන... / ගොඩැල්ලේ තරම.../ එක් වුණදාට.../ රන් විමනේ සිටිමුත්

කාව්‍යාලංකාර / කාව්‍ය උපක්‍රම

නහින දෙහින... / වරද පෙනෙන .... / ගොඩැල්ලේ .....

ඉහත කවි හෝ වෙනත් කවි මගින් සුදුසු පරිදි ගැළපෙන අදහස තහවුරු කර ඇති විට ලකුණු දෙන්න.

නැතහොත්

(i) සිලිඳුට මරණීය දණ්ඩනය නියම වීම, බබුන් සිරගත වීම, හිර පල්ලා ද පුංචි මැණිකාගෙන් සල්ලි ඉල්ලීම

(ii) අව්ව, සුළඟ, නියගය වැනි ස්වභාවික ව්‍යවසන, කැලෑව ගම, ගෙය යටකර ගැනීම ආදී සුදුසු උදාහරණ ගෙන පිළිතුර ගොඩනගා තිබීම. (ලකුණු 15)

05 * පුංචි මැණිකාට හා කර්ලිනාහාමිටත් වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට

* පුංචි මැණිකා ගෙයි පිල පිට ඉද වැඩිකලක් නිකටට අත තබා කල්පනා කිරීම

* බබුන්ගේ මියයෑම

* මෙවැනි යෝග්‍ය අවස්ථා වලින් ගැළපෙන පිළිතුරු ගොඩනගා ඇත්නම් ලකුණු පිරිනමන්න. (ලකුණු 10)

06 * නලඟන රඟුමේ ගැළපෙන කවි උපුටාගෙන තිබිය යුතුයි.

* ළඟ ළඟවා ....

* යටැසින් ලන බැල්මෙන් ....

* දිමුතු යසස්වන්

* රූ රැසේ ....

* පුන් මදාරා (ලකුණු 10)

07 * චරපුරුෂ සේවය...

* ගිරා පොතක යොදාගැනීම....

* කේවට්ටගේ උපායන් පැරදවීමට යොදා ඇති උපායන්

* ධර්ම යුද්ධය (අදාළ උධෘත සහිතව නම් නියමිත ලකුණු ලබාදිය යුතුය.) (ලකුණු 10)